**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**සති පාසල් වැඩසටහන**

**10 ශ්‍රේණිය**

**නොවැම්බර් 2 වන සතිය**

## ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ මුද්‍රා

ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ආශ්‍රිතව මුද්‍රා 2000කට අධික සංඛ්‍යාවක් හමුවී ඇත. වෙළඳ භාණ්ඩවල ඇසුරුම් සළකුණු වශයෙන් යෙදීමට මෙම මුද්‍රා භාවිත කළ බව අනුමාන කරයි. මෙම මුද්‍රා වල රූප වලට අමතරව අක්ෂර දක්නට ඇති අතර ඒවා මේ වන තෙක් කියවීමට හඳුනාගෙන නැත. මුද්‍රා මගින් ඉන්දු නිම්න වැසියන්ගේ ආගමික ඇදහිලි, විශ්වාස පිළිබිඹු කරන අතර ඔවුන්ගේ ජීවන විලාසය, සංස්කෘතික ලක්ෂණ, කලා කෞශල්‍ය හා තාක්ෂණික හැකියාව පිළිබඳ තොරතුරු අනාවරණය වේ.

### 1. මොල්ලිය සහිත ගව රුව




- කලාත්මක ප්‍රකාශනයක් සහිත මෙම මුද්‍රාවේ ගවයාගේ ගති ස්වභාවය ඉතා තාත්වික ලෙස නිරූපණය කර තිබේ.
- පාර්ශවදර්ශී ස්වරූපයෙන් යුතු ගව රූපයේ ශරීරාංග තුළින් ශක්තිය, තේජස හා ජව සම්පන්න බව හොඳින් ඉස්මතුව පෙනෙයි.
- ශිව දෙවියන්ගේ වාහනය වන නන්දි ගවයා මින් සංකේතවත් කරන බව අදහස් කෙරේ.
- බෙල්ලේ රැළි ශෛලිගතව නිරූපණය කර ඇත.
- ඇතැම් මුද්‍රාවල ගව රූපය අභියස සුවඳ දුම් ආදී දේ දක්නට තිබූ නිසා මෙම ගව රූප අති පූජනීය වස්තු ලෙස සළකා පුද පූජා තබන්නට ඇතැයි සිතිය හැක.
- මෙම මුද්‍රාවට අමතරව එක් අඟක් සහිත ගවයා, කොට අං සහිත ගව රූප ආදී ගව සංකේත සහිත මුද්‍රා විශාල සංඛ්‍යාවක් හමුවී තිබේ.

**ඉහත කරුණු ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. මෙම මුද්‍රාවෙහි ගව රුවේ ශරීරාංග තුළින් ඉස්තුව පෙනෙන ලක්ෂණ මොනවාද?
2. මෙම ගවයා මගින් සංකේතවත් වන්නේ කුමක්ද?
3.මෙම ගව රුවේ බෙල්ලේ රැළි නිරූපණය කර ඇත්තේ කිනම් ස්වරූපයකටද?
4. ඉන්දු නිම්න වැසියන් මෙම ගව රූප පූජනීයත්වයෙන් සැළකූ බවට නිදසුනක් සපයන්න
5. මෙම මුද්‍රාවට අමතරව හමුවූ වෙනත් මුද්‍රා මොනවාද?

## 2. පශුපති (ශිව) මුද්‍රාව



- මෙම මුද්‍රාව අං සහිත දෙවියා ලෙස හඳුන්වයි.
- ඔහුගේ හිස මත අං යුගළක් සහිත ශීර්ෂාභරණයක් සහ ගෙළ හා දෙඅත් වස්ත්‍රාභරණවලින් සරසා ඇත.
- ආසනයට පහළින් මුවෝ දෙදනෙක් සහ දේව රූපය වටා රයිනෝ, වෘෂභ, හස්ති සහ කොටි රූප දැකගත හැක.
- මෙහි නිරූපිත දෙවියන් ශිවගේ මූලාදර්ශයක් බව සර් ජෝන් මාර්ෂල් මහතා පවසා ඇත. එනම් ශිවගේ එක් වේෂයක් වන පශුපති (කෘෂිකර්මාන්තයට අධිපති) මින් නිරූපිත බවයි.
- දේව රූපය ඉදිරි පෙනුමෙන් හා සෙසු සියලු සත්ව රූප පාර්ශවදර්ශීව දක්වා ඇත.

**ඉහත කරුණු ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. මෙම මුද්‍රාව හඳුන්වන වෙනත් නමක් සඳහන් කරන්න
2. මෙම මුද්‍රාවේ දක්නට ලැබෙන සතුන් නම් කරන්න
3. මෙම මුද්‍රාව සම්බන්ධයෙන් ජෝන් මාර්ෂල් මහතාගේ අදහස කුමක්ද?
4. පශුපති යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක්ද?
5. මෙහි සියලු සත්ව රූප දක්වා ඇත්තේ කිනම් ස්වරූපයකටද?